# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1988 අංක 47 දරන
# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


1988 දෙසැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය**

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 30/86

**1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතේ 4 වන වගන්තිය ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **1980 අංක 46 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(3) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය හා පාලනය මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඉ) සාමාජිකයන් එක් ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් ඇති සෑම විශ්‍රාන්තිය සමිතියක ම විධායකය විසින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු:

මේ ඡේදයේ කාර්ය සඳහා "විධායකය" යන්න විශ්‍රාන්තිය සමිතියක් හා සම්බන්ධව යෙදෙන විට එයට විශ්‍රාන්තිය සමිති ආඥාපනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වන මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේ ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

2—ඒ 104497—10.860 (88/09)

" (අ) මේ පනතේ යටතේ දායක මුදල්, අධිභාර, ණය, ප්‍රදාන, පොලී, ලාභාංශ, සාමාජිකයන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් සේවායෝජකයන් විසින් ගෙවන තැන්පත් මුදල්, බැංකුවලින් හෝ වෙනත් ප්‍රභවයන්ගෙන් ගන්නා ණය සහ ආයෝජනවලින් හා නිශ්චල හෝ චංචල දේපළ විකිණීමෙන් ලබා ගන්නා සියලු මුදල් හෝ වෙනත් කවර වූ හෝ ආකාරයක ගෙවීම් මණ්ඩලය විසින් භාර ගත යුතු අතර, මණ්ඩලය විසින් ඒ සියලු මුදල් අරමුදලට බැර කළ යුතු ය. ";

(2) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (අඅ) මණ්ඩලය විසින් යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත් කර ගැනීම, ඇරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි ය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8අ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

**5.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 8 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" මණ්ඩලයේ මුද්‍රාව.

8අ. මණ්ඩලයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන් භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය ; තව ද

(ඇ) යම් ලේඛනයකට තැබීම, මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර නොකළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ " අදහස් කරන ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු " යන වචන වෙනුවට " අදහස් කරන ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු හෝ සංක්‍රමණික කම්කරුවකු " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) යම් තැනැත්තකු, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අරමුදලේ සාමාජිකයකු වන අවස්ථාවක, ඔහු විසින් එක් එක් මාසය සඳහා, පසුව එළඹෙන මාසයේ අවසාන දිනයේ දී හෝ ඒ දිනයට පෙර රුපියල් විසිපහකට හෝ එහි ගුණිතයකට සමාන මුදලක් වන දායක මුදලක් ගෙවිය යුතු ය. එහෙත් මාසික දායක මුදල ලිත් වර්ෂය තුළ දී නොවෙනස්ව පැවතිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඔහුගේ ස්වයං රැකියා නියුක්තිය නතර වූයේ යම් දිනයක දී ද ඒ දින සිට" යන වචන වෙනුවට "ඔහුගේ ස්වයං රැකියා නියුක්තිය නතර වූයේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය නතර වූයේ හෝ යම් දිනයක දී ද ඒ දින සිට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තිය අගට මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) (1) වන උපවගන්තිය යටතේ අරමුදලේ සාමාජිකයකු බවට පත්වන තැනැත්තකු විසින් යම් ලිත් වර්ෂයක අනුක්‍රමික මාස තුනක් හෝ ලිත් වර්ෂයක් තුළ එකතුව මාස පහක් වන මුළු කාලයක් හෝ දායක මුදල් ගෙවනු නොලැබූ විටක, අරමුදලේ ඒ සාමාජිකයාගේ දායක මුදල් මත ඒ ලිත් වර්ෂය වෙනුවෙන් යම් පොලියක් හෝ ලාභාංශයක් ලැබීමට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද අරමුදලේ යම් සාමාජිකයකුට හෝ සාමාජිකයකු සම්බන්ධයෙන් මේ පනත යටතේ යම් ප්‍රතිලාභයක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවනු ලබන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වී එකී මුදල් ප්‍රමාණය ගෙවන දිනයට කලින් මාසයේ අවසාන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, එකී කාලසීමාව අවසන් වන දිනයේ දී එකී සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට වර්ෂයකට සියයට තුනක අනුපාතයක පොලියක් ගෙවනු ලැබිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සේවා නියුක්තිය අවසන් කළ විට සේවා නියුක්තයන්ට ප්‍රතිලාභ ගෙවීම.

23. (1) 24 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ස්වකීය පෞද්ගලික ගිණුමෙහි යම් සේවා නියුක්තයකුගේ බැරට තිබෙන මුදල, ඔහුගේ සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ විට, මණ්ඩලය විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද අරමුදලේ සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙහි ඔහුගේ බැරට තිබෙන යම් මුදලක්—

(අ) ඒ සාමාජිකයා වයස අවුරුදු හැටට වැඩි වින්නා වූ අවස්ථාවක හැර; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවට ආපසු නොපැමිණීමේ චේතනාවෙන් හෝ විදේශයක ස්ථිර පදිංචිය සඳහා හෝ ශ්‍රී ලංකාවෙන් පිටවී යාමට සිටින බවට ඒ සාමාජිකයා විසින් ලේඛනමය සාක්ෂි මගින් මණ්ඩලය සෑහීමට පත් කරනු ලබන අවස්ථාවක හැර,

අවුරුදු පහක කාලසීමාවක් ඇතුළත එක් වරකට වැඩියෙන් ආපසු ලබා ගැනීමට ඒ සාමාජිකයා හිමිකම් නොලැබිය යුතු ය.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව තිබුණ ද මේ පනත අදාළ වන සේවා නියුක්තයකු—

(i) රජයේ සේවයෙහි;

(ii) 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත මගින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන සේවයෙහි;

(iii) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 47 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දිසා සේවාවෙහි; හෝ

(iv) පළාත් පාලන සේවයේ සාමාජිකයකු වශයෙන් හැර යම් පළාත් පාලන ආයතනයක සේවයෙහි

විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තියක් භාරගත් අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප් සහිත පත්වීම භාරගත් දින දී ඒ සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට තිබුණු මුදල මණ්ඩලය විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "23 වන වගන්තියේ විධිවිධානවල" යන වචන හා අංක වෙනුවට, "23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ විධිවිධානවල" යන වචන හා අංක ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :

"(3) මේ වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ සේවා නියුක්තයකු විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතිකයක නිර්ව්‍යාජත්වය පිළිබඳව සැක කිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට හේතු ඇති විට, ඔහු විසින් ඒ සේවා නියුක්තයා යථා පරිදි සංයුක්ත කරන ලද වෛද්‍ය මණ්ඩලයක් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු හෝ විසින් නැවත පරීක්ෂා කරනු ලැබීම සඳහා යොමු කරනු ලැබිය හැකි අතර, එසේ නැවත පරීක්ෂා කිරීමේ දී, මුල් වෛද්‍ය සහතිකය, යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් අසත්‍ය බව සොයා ගනු ලැබූ අවස්ථාවක මණ්ඩලය විසින් ඒ සහතිකය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. තවද ඒ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා විසින් ඉන් පසුව නිකුත් කරන වෛද්‍ය සහතික පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට මණ්ඩලයට හිමිකම තිබිය යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (2) උපවගන්තියේ "පැහැර හැරි සේවා යෝජක පදිංචිව සිටින හෝ එකී සේවා යෝජකට අයිති යම් නිශ්චල හෝ චංචල දේපළ පිහිටා ඇති" යන වචන වෙනුවට "පැහැර හැරීම සිදු කර ඇත්තේ යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් ද ඔහු ඒ පැහැර හැරි සේවා යෝජකයා විසින් සේවයේ නියුක්ත කරනු ලබන හෝ සේවයේ නියුක්ත කරනු ලැබූ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "ඒ සේවා යෝජකයාගේ සේවා ස්ථානය කෙරෙහි" යන වචන වෙනුවට "පැහැර හැරීම සිදුකර ඇත්තේ යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් ද ඔහුගේ සේවා ස්ථානය පිහිටා ඇති කොට්ඨාසය කෙරෙහි" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"හිමිකම්පෑම්, මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් නිශ්චය කළ යුතු බව.

33. (1) අරමුදලෙන් යම් ගෙවීමක් සඳහා වන සියලු හිමිකම් පෑම්, මණ්ඩලය විසින් හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ නිශ්චය කරනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ හෝ එවැනි නිලධරයකුගේ හෝ නිශ්චය කිරීම, ඊට විරුද්ධව කරන අභියාචනයක දී දෙනු ලැබිය හැකි තීරණයකට යටත්ව, අවසානාත්මක විය යුතු ය.

(2) මණ්ඩලයේ නිලධරයකු විසින් (1) වන උප වගන්තිය යටතේ කරන ලද නිශ්චයකින් අතෘප්ත කවර හෝ තැනැත්තකුට ඒ නිශ්චය කිරීම දන්වනු ලැබීමෙන් දවස් තිහක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඊට විරුද්ධව මණ්ඩලය වෙත අභියාචනයක් කළ හැකි ය. යම් අභියාචනයක දී මණ්ඩලය විසින් ඒ නිලධරයාගේ නිශ්චය කිරීම ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ උත්සාරණය කිරීම කළ හැකි අතර එවැනි යම් අභියාචනයක දී මණ්ඩලයේ තීරණය 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්ය සඳහා මණ්ඩලයේ නිශ්චය කිරීමක් ලෙස සැලකිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) අභියාචන පෙත්සම, අභියාචකට නිශ්චය කිරීම දැනුම් දෙනු ලැබීමෙන්, දින තිහක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ මේ වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකුට නිශ්චය කිරීම දැනුම් දෙනු ලැබූ දිනය ලෙස සැලකිය යුත්තේ ඒ නිශ්චය කිරීම ඒ තැනැත්තාට ලියාපදිංචි තැපැල් මගින් තැපැල් කරනු ලැබූ දිනය ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය, ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇ) ඒ සේවායෝජක විසින් තබාගත යුතු බවට මේ පනතින් හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ නියම කරනු ලැබූ යම් ලේඛනයක නැතහොත් වාර්තාවක සත්‍ය පිට පතක් හෝ උධෘතයක් හෝ ඒ ලේඛනයේ නැතහොත් වාර්තාවේ යම් කොටසක්.".

15. මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති 40 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ සහ 40ආ වගන්ති ලෙස ඒවා බලපැවැත්විය යුතු ය :— 

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 40අ සහ 40ආ සහ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

" මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් සඳහා ආරක්ෂාව.

40අ. සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා යන පරිකල්පනය මත හෝ මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සද්භාවයෙන් ක්‍රියා කිරීමේ දී මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා සිවිල් බැඳීමකට හෝ සාපරාධී බැඳීමකට යටත් නොවන්නේ ය.

මණ්ඩලය වෙනුවෙන් දරන ලද වියදම් ආපසු ගෙවීම.

40ආ. සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ විෂමාචාරය හෝ චේතනාන්විත පැහැර හැරීම හේතුකොටගෙන සිදුවී යැයි මණ්ඩලය විසින් සලකනු ලබන අලාභ සහ වියදම් හැර, මණ්ඩලයේ සෑම සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී හෝ ඉට කිරීම හා සම්බන්ධයෙන් හෝ දරන ලද සියලු අලාභ සහ වියදම් සඳහා, ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට අරමුදලින් හානිපූරණය කළ යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය මෙහි පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ඉපැයීම්" යන්නෙහි අර්ථකථනයට පෙරාතුවම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"යථා පරිදි සංයුක්ත කරන ලද වෛද්‍ය මණ්ඩලය" යන්නෙන් යම් තැනැත්තන් විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතික සාධාරණ සැකයක් මතු කරයි ද, ඒ තැනැත්තන් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලයේ සභාපතිවරයා විසින් කරන ඉල්ලීමක් අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද වෛද්‍ය මණ්ඩලයක් අදහස් වේ;';

(2) "ඉපැයීම්" යන්නෙහි අර්ථකථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"ඉපැයීම්" යන්නෙන්—

(අ) වේතන, වැටුප් හෝ ගාස්තු;

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව සහ වෙනත් සමාන දීමනා;

(ඇ) නිවාඩු දින සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම්;

(ඈ) නියමිත සේවානියුක්තිවල සේවා නියුක්තයන්ට සේවායෝජකයා විසින් සපයනු ලැබූ පිසූ හෝ නොපිසූ ආහාරවල මුදල් වටිනාකම සහ එසේ සප

යනු ලැබූ ආහාර පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ හෝ එම ආහාරවල අඩංගු යම් ද්‍රව්‍යයක මුදල් වටිනාකම ; සේවායෝජකයා විසින් තක්සේරු කළ යුතු එම වටිනාකම කම්කරු කොමසාරිස්වරයා වෙත කරනු ලබන අභියාචනයට යටත් විය යුතු අතර එම අභියාචනය පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය ;

(ඉ) ආහාර දීමනාව; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් අන් දමේ පාරිශ්‍රමික අදහස් වේ ; ';

(3) "සේවා නියුක්තයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම ප්‍රකාශිත හෝ ගම්‍යමාන නැතහොත් වාචික හෝ ලිඛිත වුවද ඒ ගිවිසුම සේවය සම්බන්ධයෙන් හෝ ආධුනිකත්වය සම්බන්ධයෙන් හෝ ගිවිසුමක් වුවද නැතහොත් ශ්‍රමය සම්බන්ධයෙන් වූ යම් වැඩක් පෞද්ගලිකවම ක්‍රියාත්මක කිරීම පිණිස වූ ගිවිසුමක් වුවද කවර වූ හෝ යම් තත්වයකින් සේවායෝජකයකු සමග ගිවිසුමකට ඇතුළු වූ හෝ ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තා අදහස් වන අතර යම් තැනැත්තකු යම් විශේෂ අවස්ථාවක දී සේවයෙහි නියුක්ත වුවද සේවයෙහි නියුක්ත නොවූවද එවැනි යම් ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ ; ';

(4) "සේවා යෝජක" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"සේවා යෝජක" යන්නෙන් යම් කම්කරුවකු සේවයේ නියුක්ත කරන යම් තැනැත්තෙක් හෝ යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කම්කරුවකු සේවයේ නියුක්ත කරනු ලැබේ ද ඒ වෙනත් යම් තැනැත්තා හෝ අදහස් වන අතර, සේවා යෝජක මණ්ඩලයක් (ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෘත්තීය සමිතියක් වුවද) ඒ මණ්ඩලය ද, වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයේ නියුක්ත කරන යම් තැනැත්තකු ද ඊට ඇතුළත් වේ. තවද, යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ වෙළෙඳ ආයතනයක නිසි බලධරයකු, නීත්‍යනුකූල උරුමකරු, නීතිය අනුව අනුප්‍රාප්තිකයා, පොල් මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු සහ සමාගමක ඈවරකරු ද ඇතුළත් වේ ; තවද සංස්ථාගත නොකළ මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ලේකම්වරයා ද හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට එහි කළමනාකාර හවුල්කරු හෝ කළමනාකරු ද ඇතුළත් වේ ; ';

(5) "සේවා යෝජක" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

'"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, කරන හා ඉටුකරන යම් බලතලවලට, කාර්යවලට හෝ කර්තව්‍යවලට අනුරූප හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ ඇති කරන ලද හා පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"සංක්‍රමණික කම්කරුවා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නා වූ එහෙත් ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්තව ඇති යම් තැනැත්තෙක්, එසේ සේවයෙහි නියුක්තව ඇති තාක් කල් අදහස් වේ;'

17. ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව තිබුණ ද,— අන්තර්කාලීන විධිවිධාන.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ ඒ පනතේ අර්ථානුකූල උසස් අධ්‍යාපන ආයතනයක හෝ;

(ආ) 1971 අංක 19 දරන ජාතික ආධුනිකත්ව පනත මගින් පිහිටුවන ලද ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ

සේවා නියුක්තයකුගේ පෞද්ගලික ගිණුමේ බැරට, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ඇති මුදල, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට මාස හයක් ඇතුළත ඒ සේවා නියුක්තයාට මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය.

(5) "සේවා යෝජක" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

'"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශිය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, කරන හා ඉටුකරන යම් බලතලවලට, කාර්යවලට හෝ කර්තව්‍යවලට අනුරූප හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ ඇති කරන ලද හා පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"සංක්‍රමණික කම්කරුවා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නා වූ එහෙත් ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්තව ඇති යම් තැනැත්තෙක්, එසේ සේවයෙහි නියුක්තව ඇති තාක් කල් අදහස් වේ;'

17. ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව තිබුණ ද,— අන්තර්කාලීන විධිවිධාන.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ ඒ පනතේ අර්ථානුකූල උසස් අධ්‍යාපන ආයතනයක හෝ;

(ආ) 1971 අංක 19 දරන ජාතික ආධුනිකත්ව පනත මගින් පිහිටු වන ලද ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ

සේවා නියුක්තයකුගේ පෞද්ගලික ගිණුමේ බැරට, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ඇති මුදල, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට මාස හයක් ඇතුළත ඒ සේවා නියුක්තයාට මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.